**LING E 2025**

**වාග්විද්‍යා ඉතිහාසය හා ඓතිහාසික වාග්විද්‍යාව**

**අනිවාර්ය පාඨමාලාව**

**අභිමතාර්ථ :**

අතීතයේ සිට විසි වන සියවසේ අවසානය දක්වා භාෂා අධ්‍යයන ඉතිහාසය හැදෑරීම.

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවන්ගේ පරිණාමය ආශ්‍රයෙන් සිරස් අධ්‍යයන පිළිබඳ ක්‍රම හා නයායන් හැදෑරීම.

**ඉගෙනුම් ඵල :**

වාග්විද්‍යාවේ ඉතිහාසය -

මෙම පාඨමාලාව අවසානයේ ශිෂ්‍යයාට,

- වාග්විද්‍යාව, පුරාතන ව්‍යාකරණ සම්ප්‍රදායේ පරිණාමය ලෙස හඳුනා ගැනීමට
- ප්‍රධාන ව්‍යාකරණ සම්ප්‍රදායන් ද්විත්වය හඳුනා ගැනීමට : ඉන්දියානු හා ග්‍රීක
- එම ව්‍යාකරණ සම්ප්‍රදායන්ගේ එකතුවක් ලෙස වාග්විද්‍යාව හඳුනා ගැනීමට
- කාලානුරූපව වාග්විද්‍යාත්මක න්‍යායන් වෙනස්වන බව හඳුනා ගැනීමට

ඓතිහාසික වාග්විද්‍යාව -

මෙම පාඨමාලාව අවසානයේ විද්‍යාර්ථීයාට,

- භාෂා පරිණාමයේ යාන්ත්‍රණය පැහැදිලි කිරීමට
- භාෂා පරිණාම සිද්ධි විස්තර කිරීමට
- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවන්ට බලපාන ශබ්ද පරිණාම විධි හා එහි ප්‍රතිඵල හඳුනා ගැනීමට
- ඉන්දු යුරෝපීය හා ද්‍රාවිඩ භාෂා පවුල් සඳහා විශේෂ අවධානය යොමු කරමින් භාෂා පවුල් සංකල්පය පැහැදිලි කිරීමට
- විශේෂිත භාෂා පවුලකට හෝ උප පවුලකට සම්බන්ධ කරමින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අර්ථ නිරූපණය කිරීමට ශක්‍යතාව ලැබිය යුතුය.

**අන්තර්ගතය :**

වාග්විද්‍යාවේ ඉතිහාසය -

- ආදී ඉන්දියානු ව්‍යාකරණ සම්ප්‍රදායපාණිනිගේ 'අෂ්ටධ්‍යායී' කෘතියට විශේෂ අවධානය යොමු කරමින් වෛදික යුගයේ භාෂා අධ්‍යයන්ගේ ආරම්භය හා භාතෘහරී වැනි ව්‍යාකරණඥයන්ගේ භාෂා අධ්‍යයනයන් හැදෑරීම.
- ආදීයුරෝපීය ව්‍යාකරණ සම්ප්‍රදායආදී ග්‍රීසියේ භාෂා අධ්‍යයන සහ රෝමානු ව්‍යාකරණඥයන්ට ඒ මගින් ඇති වූ බලපෑම.

- පුනරුද සමයේ භාෂා අධ්‍යයනයන්හි වර්ධනය
- බටහිර විද්‍යාර්ථීන්ට සංස්කෘත භාෂාව හඳුන්වාදීම හා දහනව වන සියවසේ ඇති වූ ඓතිහාසික හා තුලනාත්මක වාග්විද්‍යාවේ වර්ධනය
- විසි වන සියවසේ නූතන වාග්විද්‍යාවේ ආරම්භය

ඓතිහාසික වාග්විද්‍යාව -

- භාෂා පරිණාම සාධක
  - ➢ ශබ්ද පරිණාමය
  - ➢ සෘණීකරණය
  - ➢ අතිදේශය
- භාෂා පරිණාම සිද්ධි
  - ➢ ශබ්ද පරිණාමය
  - ➢ ශබ්දිම පරිණාමය
  - ➢ ව්‍යාකරණමය පරිණාමය
  - ➢ වාක්‍යමය විචාරාත්මක පරිණාමය
  - ➢ වාක්කෝෂීය පරිණාමය

**ඇගයීම් :**

වර්ෂ අවසාන පරීක්ෂණය : පැය තුනක (03) ප්‍රශ්න පත්‍රය.

**නිර්දේශිත කියවීම්:**


ජයසේකර, ආනන්ද. ජයසේකර, චිත්‍රා. *තුලනාත්මක වාග්විද්‍යාව*, කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්,

කරුණාතිලක, ඩබ්ලිව්. එස්., *ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය,* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම,

Allen, A.J. (1953). *Phonetics in Ancient India*. London.

Lehmann, W.P. (1967). *A Reader in nineteenth century historical* Indoeuropean Linguistics, Bloomington.

Nettleship, H. (1886). The study of grammar among the Romans in the *first century A.D.* NettJournal of philosophy, London.

Robins, R.H. (1951). *Ancient and Medieval grammatical theory inEurope*. London.

Robins, R.H. (1979). *A Short History of Linguistics*. Longman, London.

Vachek, J. (1966). *The Linguistics School of Prague*, Bloomington.

Wulf, De M. (1909). *History of medieval Philosophy*. London.